රටක සංවර්ධන ක්‍රියාවලිය සාර්ථකත්වයෙහි ලා නිවැරදි දේශපාලන දෘෂ්ටිවාදයක වැදගත්කම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

සේන නානායක්කාර

මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍රපීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*sena@rjt.ac.lk / senananayakkara@yahoo.com

කේන්ද්‍රීය වචන : සංවර්ධනය, දේශපාලන දෘෂ්ටිවාදය, සමාජ පෞරුෂය, ස්වාධිපත්‍යය, ප්‍රජාතන්ත්‍රවාදය

හැඳින්වීම සහ අරමුණ

රටක සමාජ, ආර්ථික හා සංස්කෘතික යන පාර්ශවත්‍රයේ ම දක්වෙන යහපත් ඍද්ධියමය ස්වභාවය වූ කලී සංවර්ධනය යැයි සරල ව හඳුන්වමු. නමුත්, එකී සකලවිධ පාර්ශවයන් ආවරණය කෙරෙන්නා වූ ත්, සියලු අන්තර් සම්බන්ධතා තහවුරු කෙරෙන්නා වූ ත්, සමාජ ක්ෂේත්‍රයක් ලෙස දේශපාලනයට හිමිවනුයේ සුවිශේෂ ස්ථානය කි. කවර සමාජ කොට්ඨාසයකට වුව ඉන් සිදුකෙරෙන බලපෑම අතිශය විශාල ය. සංකීර්ණ මෙන්ම විවාදාපන්න ය. අඩු වැඩි වශයෙන් එහි දක්වෙන විචල්‍යතා කෙරෙහි එවකට පවත්නා සමාජ සාධක සුවිශේෂයෙන් බලපවත්වනු ලබයි. එබැවින්, උක්ත ශීර්ෂය සම්බන්ධයෙන් සලකාබලන කල දේශපාලන දෘෂ්ටිවාදයක බලපෑම් සහගත වැදගත්කම කැපී පෙනේ. විධිමත් ශාස්ත්‍රීය ප්‍රතිෂ්ඨාවක සිට එකී බලපෑම සමාජවිද්‍යාත්මක විග්‍රහයකට ලක්කිරීම මෙම පර්යේෂණයෙහි අද්‍යාශය ලෙස ගැනේ.

අධ්‍යයන ගැටලුව

සංවර්ධන ක්‍රියාවලියක සාර්ථකත්වයෙහි ලා නිවැරදි දේශපාලන දෘෂ්ටිවාදයක වැදගත්කම කෙබඳු ද? (සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යස්ථභාවයක සිට මේ පිළිබඳ අවධානය යොමුකිරීම මෙතුළින් සිදුකෙරේ.)

අධ්‍යයන ක්‍රමවේදය

මුද්‍රිත මූලාශ්‍ර මුල්කොටගත් ලිඛිත සාහිත්‍යය පරිශීලනය කිරීම මෙහි ප්‍රමුඛතම අධ්‍යයන ක්‍රමවේදය ලෙස ගැනේ. සංවර්ධනය සම්බන්ධයෙන් ගත් කල මානව සමාජයේ ඓතිහාසික ගමන්මග හෙවත් එහි විකාශනය විමසුමට බඳුන්කිරීම අත්‍යවශ්‍ය ය. අතීත වර්තමාන අනාගත යන කාලත්‍රය හා බැඳෙන පොදු සාධක හා සාක්ෂි අප්‍රමාණ වූ ලිඛිත සාහිත්‍යය තුළින් විවිධ සමාජ ව්‍යුහයන් ඒ කෙරෙහි දක්වූ අවධානය පැහැදිලි ව හඳුනාගත හැකි ය. එය පුද්ගලික, පොදුජන හෝ ආයතනික විය හැකි ය. රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ව්‍යුහයක් යටතේ ද විය හැකි ය. කවර කේන්ද්‍රයක සිට විග්‍රහ කළ ද, එය වඩාත් ඵලදායි ක්‍රමවේදයක් ලෙස භාවිත කළ හැකි ය.

කේන්ද්‍රීය ගැටලුවට අදාළ දත්ත විග්‍රහයේදී හුදෙක් සංඛ්‍යාත්මක සටහන් හෝ සංගණනාත්මක ප්‍රමාණයන්ට වඩා, විෂයමූලික තොරතුරු සහිත විමර්ශනාත්මක

කාරණා වැදගත් ලෙස කැපී පෙනෙන්නේ එබැවිනි. ඒ අනුව අදාළ විෂයමූලික දත්ත සමාජවිද්‍යාත්මක විමසුමට භාජන කිරීම මෙහි භාවිත ක්‍රමවේදය ලෙස හඳුනාගැනේ.

ප්‍රතිඵලය සහ සාකච්ඡාව

සියලු ක්ෂේත්‍රයන්හි දැක්විය හැකි යහපත් වර්ධනීය ස්වරූපය "සංවර්ධනය" ලෙස විග්‍රහ කෙරේ. ක්‍රියාවලියක් ලෙස එය අතිශය පුළුල් වන අතර සමස්තය තුළ සිදුකෙරෙන සංකීර්ණ ක්‍රියාදාමය කි. මාධ්‍යය, පුද්ගලයින්, ජන කණ්ඩායම්, විවිධ ආයතන, පාරිසරික හා වෙනත් භෞතික තත්ත්වයන් ආදී බොහෝ දේ ඊට අයත් ය. එබැවින්, ඒ සඳහා යට කී සමස්තය අත්‍යන්තයෙන් බැඳී පැවතිය යුතු ය. ඒ අනුව දේශපාලනය වූ කලී උක්ත සියලු පාර්ශවයන් ආවරණය කෙරෙන ප්‍රමුඛතම සමාජ ක්ෂේත්‍රයක් ලෙස ගැනේ. විවිධ හා විෂම මානව සමාජ සංහතිය තුළ උපරිම සමාජ වටිනාකම් ලෙස ගැනෙන ප්‍රාග්ධනය, තාක්ෂණය හා බලය කෙරෙහි සුවිශේෂ බලපෑම් කරන්නට සමත් සමාජ විභවයක් ලෙස (Colman, 1972) දේශපාලනය නම් කෙරේ. ඊට අදාළ ව ප්‍රමුඛත්වයෙහි ලා ගැනෙන වැදගත් කාරණා ද්විත්වය කි.

i. පොදුජන නිදහස හා ස්වාධිපත්‍යය
ii. දේශපාලන විඤ්ඤාණය සහිත සමාජ පෞරුෂය

සංවර්ධනය වූ හෝ වෙමින් පවත්නා රටක සමාජ ප්‍රගතිශීලී සංලක්ෂණ ලෙස මේවා හැඳින්වෙයි. එනම්, සමාජ සංවර්ධනයෙහි ලා සාධනීය ලෙස බලපෑවැත්වෙන සමාජ සාධක වශයෙනි. රටක් හෝ ජාතියක් ලෙස ගත් කල, තමන් විසින් තමන් පාලනය කරගැනීමේ අවකාශය ත්, වෙනත් කිසිවෙකුට යටත් නොවී ස්වාධීන ව තීරණ ගැනීමේ හැකියාව ත් නිදහස සහ ස්වාධිපත්‍යයෙන් අර්ථවත් වෙයි.

දේශපාලන විඤ්ඤාණය සහිත සමාජ පෞරුෂය තුළින් උක්ත සමාජ සංලක්ෂණ තවදුරටත් තහවුරු කරනු පෙනේ. ඒ අනුව නූතනයේ දේශපාලන විඤ්ඤාණයෙන් තොර සමාජ පෞරුෂය වූ කලී හුදෙක් හිස සුන් මළකඳකි. ඊට අනුකාරක ව ගොඩනැගෙන සමාජ දුර්ලක්ෂණයන් රාශිය කි. එනම්, මිනිස් ජීවිතය හා බැඳෙන සියලු ක්ෂේත්‍රයන් කෙරෙහි එහි හානිකර බලපෑම අනිවාර්ය වෙයි. එය සමාජ ආර්ථික හෝ සංස්කෘතික ක්ෂේත්‍රයන් කෙරෙහි පමණක් නොවේ, ඒ හා බැඳුණු සමස්ත මානව සමාජ සංවර්ධනයෙහි අවගමනය කෙරෙහි ද ප්‍රබල උත්තේජනයක් වෙයි. ආර්ථික ක්‍රියාවලිය, නිෂ්පාදන ක්‍රියාවලිය, ජීවන තත්ත්වය, යෝග්‍යතා, ආකල්ප, ආයතනික හා සමාජ ස්වභාවය ආදී ක්ෂේත්‍රයන් ඔස්සේ එකී දුර්ලක්ෂණයන් සක්‍රිය වෙයි.

තුන්වන ලෝකයේ බොහෝ රටවල බහුල වශයෙන් ව්‍යාප්ත ව පවත්නා විරැකියාව (unemployment), දරිද්‍රතාව (poverty) හා අසමානාත්මතාව (inequality) රටක සංවර්ධන ක්‍රියාකාරීත්වයෙහි ලා වන දැවැන්ත බාධක හා අභියෝග ලෙස පිළිගැනෙන අතර, (Seers, 1977) එමෙන් ම වඩාත් ගැඹුරින් විමසාබලා ඉවත් කළ යුතු සමාජ දුර්ලක්ෂණයන් ලෙස පිළිගැනේ. වියට්නාම් නිදහස් සටනේ නායක හෝ චි මිං (Ho Chi Minh 1890-1969) එය අර්ථවත් කළේ "ස්වාධීනත්වය (independency), ප්‍රජාතන්ත්‍රවාදය (democracy) හා බැඳුණු සමෘද්ධිය (prosperity) යනුවෙනි. (Mihin,

1969)" මෙහි ස්වාධීනත්වය හා ප්‍රජාතන්ත්‍රවාදය යන කාරණා සෘජුව ම දේශපාලන ක්‍රියාකාරීත්වය හා බැඳී පවත්නා අතර සමෘද්ධිය යන්න උක්ත ක්‍රියාකාරීත්වයෙහි අනුෂාංගික ඵලයක් වෙයි. එනම් දුප්පත්කම හෙවත් දරිද්‍රතාව තුරන් කිරීමෙන් ළඟාවෙන යහපත් ජීවන තත්ත්වය සහිත සමාජ වාතාවරණය යි. ඒ සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසි කිහිපයක් මෙහිදී හඳුනාගත හැකි ය. අදාළ සංවර්ධන ක්‍රියාදාමය දියත් කිරීමෙහි ලා මාර්ගෝපදේශකත්වය සපයනු ලබන දේශපාලන පාර්ශවයන් අනුගමනය කළ යුතු මෙම කාරණා එකී ක්‍රියාවලියෙහි නිවැරදි දිශානතිය පෙන්නුම් කරයි. එනම්,

1. නිශ්චිත අරමුණකින් යුතුවීම
2. සපුරා ප්‍රජාව කේන්ද්‍රකොට ගැනීම
3. අවශ්‍යයෙන් ම අභිප්‍රේරණාත්මක වීම
4. මානවහිතවාදී දෘෂ්ටිය පදනම් කොටගැනීම

මෙකී අස්ථානයන් හි පිහිටීම තුළින් කිසිදු ක්‍රියාදාමයක් හුදු පුද්ගලවාදී, ප්‍රචාරණවාදී හෝ වාණිජවාදී බවට පරිවර්තනය නොවේ. සකලවිධ ක්‍රියාකාරීත්වයන් හි මූලික පසුබිම වනුයේ නිවැරදි දේශපාලන දෘෂ්ටිවාදය යි. දේශපාලන ශිෂ්ටත්වය ලෙස අර්ථගැන්වෙන්නේ ද මෙය ම ය. රටක නිදහස, ස්වාධීනත්වය ඇතුළු දේශපාලන ශිෂ්ටත්වය දිගුකාලීන ව නිසිලෙස පවතී නම් එහි සංවර්ධන ක්‍රියාවලිය වඩාත් පහසු බව (Schramm. 1976) මෙතුළින් අවධාරණය කෙරේ.

නිගමනය

සංවර්ධනය යනු සකලවිධ පාර්ශවයන් හි යහපත් බවේ වෘද්ධිය යි. ක්‍රියාවලියක් ලෙස එහි සාර්ථකත්වයෙහි ලා බොහෝවිට පසුබිම් සැකසෙනුයේ දේශපාලන බල අධිකාරිය ඔස්සේ ය. එකී උපකල්පනය මත පිහිටා සලකාබලන කල, නිශ්චිත අරමුණක් සහිත, ප්‍රජාව කේන්ද්‍ර කොටගත්, අභිප්‍රේරණාත්මක වූ ත්, මානවහිතවාදී වූ ත් ක්‍රියාකාරීත්වය වූ කලී නිවැරදි දේශපාලන දෘෂ්ටිවාදය යි. යහපත් දැක්ම, යහපත් වැඩපිළිවෙළ හා යහපත් ප්‍රතිපත්තිය ද ඒ තුළ අඩංගු ය. එබැවින්, රටක සංවර්ධන ක්‍රියාවලිය සාර්ථකත්වයෙහි ලා නිවැරදි දේශපාලන දෘෂ්ටිවාදයක වැදගත්කම සුවිශාල ය.

පරිශීලිත කෘති

Coleman, James. S. (1972) The Politics and the development: Politics as a key role, Prinston University Press, New Jerscy.

Sees, Dudley (1977) The meaning of development: International development review, Article No.3, in the development process, A special perspective, London.

Schramm, Wibur (1976) National development and politics: Communicational approach for the political crisis exclusively in third world countries, UPB13, New York.

සුදසිංහ, එස්. (2004) දේශයක් ගොඩනැගූ මිනිසා: හෝ චි මිං, චිම් කොම් ප්‍රකාශකයෝ, හෝමාගම.